# අපේ පුංචි සමනලී



මිහිදිනී උමායා සේනානායක

# අපේ පුංචි සමනලී

## මිහිදිනී උමායා සේනානායක

- චිත්‍ර සහ කතෘගේ නම :- මිහිදිනී උමායා සේනානායක
- ISBN :- 978-624-206-821-3
- දිනය :- 2023-11-15

# පිදුම

මට සැමදා ආදරය කරන

අම්මා, තාත්තා, සීයලා, අත්තම්මා, ආච්චි, මාමා,
නැන්දලා, සෙනුක මල්ලී ඇතුලු පවුලේ සැමටත්

ලස්සනට සිංහල අත් අකුරු ලියන්න, කියවන්න කියා
දෙන

තාමිලා ගුරු මෑණියන්ටත් මාගේ පළමු නිර්මාණය

වන

“අපේ පුංචි සමනලී”

කතාව බැති සිතින් පුදමි. !

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත් වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැඟීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසල් දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍යය කෙතේ ලේඛන අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂී ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැඟී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවන්ට ගැළපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්"ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතු වන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට එක් වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණ අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දුන් වූ අප පාසලේ කළමණාකරණ මණ්ඩලය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදී ශිෂ්‍යාවන්, සෙසු පාසල් වල දරුවන් යොමු කල විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවයද අගය කරමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023-10-20

එකෝමත් එක රටක සමනල රැජිණියක් සිටියා. ඒ සමනල රැජිණි, රටේ ඉන්න පොඩිම සමනලී හරිම කඩිසරයි කියලා දන්නවා. ඒ නිසා සමනල රැජිණි ඒ පුංචි සමනලීට රැජිණගේ වත්ත ලස්සන කරන්න මල් පැළයක් ඉක්මනට ගෙනත් දෙන්න කියලා කීවා.

පුංචි සමනලී මල් පැළයක් සොයා ගන්න හොඳම තැන දූනං හිටියා. ලස්සන මල් පැළ තියන කැළයකට ගිහින්, පුංචි සමනලී ඉක්මණට පැළයක් අරන් ගෙදර යනකොට තද සුළඟක් හැමුවා.



ඔය වෙලාවේ කැළේ සෙල්ලම් කරන්න මලිතියි දිනුකුයි ඇවිල්ලා හිටියා. අනේ තද සුළඟට පුංචි සමනලීගේ අතේ තිබුණ මල් පැළය දඩාං ගාලා දිනුක්ගේ ඔළුවට වැටුණා පසුත් වැලිත් එක්කම.

දිනුක්ට හිතා ගන්න බැරිවුණා  මොකක්ද උනේ කියලා. මලිතිට නම් දිනුක් ඉන්න විදිහට හොඳටම හිනා. දිනුක්ට ඒකට තරහ ගියා.



තරහ ගියපු දිනුක් පුංචි සමනලීගෙන් පළිගන්න ගෙදර ගිහින් කූඩුවක් හැදුවා. ඒක පුංචි සමනලී දැක්කා.




පුංචි සමනලී වුණ දේ ගැන ගොඩක් දුක් වුනා. ඒ බව ඇය එයාගේ යාළු ඉබ්බට කිවුවා.



බකමූණිටත් කිවුවා.



ඔය අතරේ කැළේ සෙල්ලම් කරලා මහන්සි වුණ දිනුක් උදේ වෙනකල් හොඳටම නිදා ගත්තා.



උදේ නැගිටලා රජෙක් වගේ ඇඳ පැළඳ ලෑස්ති වුණා. ආයෙත් කැළේට ගිහින් මලිතිත් එක්ක සෙල්ලම් කරන්න.



ඒ දෙන්නා කැළේ සෙල්ලම් කරන කොට මලිති දැක්කා සමනල රැජිණ ඇවිත් කැළේ මල් බලමින් පියාඹනවා. මලිතිට කලින් දවසේ වුණ දේ මතක් වෙලා හොඳටම හිනා ගියා. ඒ පාර දිනුක්ට ආයෙත් හොඳටම තරහ ගියා. කොච්චරක්ද කීවොත් ඔළුවෙන් ගින්දර එනවා වගේ තරහ ගියා.



මේක දැකපු සුරංගනා අශ්වයෙක් ඇවිත් මලිතිගෙන් වෙච්ච දේ දැන ගත්තා.



එයා ගිහින් පුංචි සමනලීට මේ ගැන කිවුවා. සමනලීට හොඳටම දුක හිතුණා.

පුංචි සමනලීට සුරංගනා අශ්වයාගේ මැජික් බලෙන්, මිනිසුන්ට කතා කරන්න පුළුවන් විදිහට වරමක් දුන්නා.

පුංචි සමනලී ඉක්මණට ගිහින් දිනුක්ගෙන් සමාව ඉල්ලුවා. දිනුක්ගේ තරහ නිවුනා. ඒ ඔක්කොම හොඳ යාළුවෝ වුණා.



නිමි.!

# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පෙත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින්රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේදී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදන වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මඟපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මාහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට
සෙනෙවිරත්න මහලේකම්ගේ
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ
2023-10-20